
# අබිනික්මන



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# අභිනික්මන

## (පහන් කණුව දෙසුමකි)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2003

ධර්මදානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2003 අගෝස්තු

'සබ්බ දානං ධම්මදානං ජිනාති'

ප්‍රකාශනය

ප්‍රගති වීරකෝන්
කාංචන ධර්මසේන
රණදේව ජයසේකර

මුද්‍රණය

කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැහිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
දුරකතනය: 074-302312

# හැඳින්වීම

බුද්ධ වචනයට අනුව 'සම්මා සංකප්ප' නම් වූ යහපත් සංකල්පනා අතුරෙන් නෙක්ඛම්ම සංකල්පයට ප්‍රධාන තැන හිමිවේ. අනාගත කාලයක් සසර බැම්වලින් බැඳී මිරිකී සිටි ලෝක සත්ත්වයාට ඒ බැමි සිඳ බිඳ දමා විමුක්තිය දිනා ගැනීමේ අඩිටන පහළවනුයේ නෙක්ඛම්ම සංකල්පය මුහුකුරා යාමෙනි. පැවිදි පරමාර්ථය නියමාකාරයෙන්ම ඉටුකර ගැනීමට නෙක්ඛම්ම සංකල්පය අත්‍යවශ්‍යවේ.

ඒ කෙසේ වුවද විවිධ සමාජ විපර්‍යාස හේතුකොටගෙන නෙක්ඛම්ම සංකල්පයේ ශ්‍රේෂ්ඨත්වය ලෝකයාට අමතක වන තැනට කරුණු යෙදෙනු පෙනේ. මෙම 'පහන් කණුව' දෙසුම, ලොවුතුරු පැතුම් රැගත් ඒ උදාර සංකල්පනාවේ සනාතනික අගය සිහිපත් කර දෙයි.

ධර්මදානයක් වශයෙන් මෙම දෙසුම මුද්‍රණය කරවීමට, බත්තරමුල්ල, ජිනානන්ද මාවතේ අංක 28/4 හි නිවැසි පින්වත් ප්‍රගති වීරකෝන් මහතාත්, දේවාලේගම, බංගලාවත්තේ පින්වත් කාංචන ධර්මසේන මහතාත්, කොළඹ 05 කිඹිරිගස්යාය පාරේ 136 හි නිවැසි පින්වත් රණදේව ජයසේකර මහතාත් (සිය පියාණන්ට පින් පිණිස) සැදැහැ සිතින් පරිත්‍යාගශීලීව ඉදිරිපත් වූයෙන් ධර්මදානමය කුශලය ඔවුන් සැමට පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය වේවායි පතමු.

මෙයට
සසුන් ලැදී,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර
දේවාලේගම
(2547) 2003 ජුනි

'නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

න තං දළහං බන්ධනමාහු ධීරා
යදායසං දාරුජං බබ්බජඤ්ච
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරේසු ච යා අපෙඛා

එතං දළහං බන්ධනමාහුධීරා
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනො කාමසුඛං පහාය

- තණ්හා වග්ග ධ.ප -

සැදැහැවත් පින්වතුනි,

බුදු පියාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන කාලයේදී එක් අවස්ථාවක පසේනදී කොසොල් රජ්ජුරුවන්ගේ භටයින්, මං පහරන, ගෙවල් බිඳින, මිනීමරු . සොරුන් කණ්ඩායමක් ගෙනල්ලා රජු ඉදිරියට පැමිණෙව්වා. රජතුමා ඒ හොරුන්ව බන්ධනාගාරයේ දමන්න නියම කළා. නොයෙක් විදියේ රැහැන්වලින් මාංචු ආදියෙන් බැදලා සිර කරන්න සැලැස්සුවා. ඈත ජනපදවලින් බුදු පියාණන් වහන්සේ දකින්න වැඩම කළ සංඝයා වහන්සේලා පිරිසක් පසු දවසේ පිණ්ඩපාතයේ වඩින අතරේ අර බන්ධනාගාරයට ගිහිල්ලා අර හොරුන් දැකලා ලොකු සංවේගයකට පැමිණිලා ඇවිල්ලා බුදු රජාණන් වහන්සේට කියනවා "භාග්‍යවතුන් වහන්ස, අද අපි පිණ්ඩපාතයේ වඩින අතර සිර ගෙදර සිර කරපු අය බැදලා ඉන්නා ආකාරය දැක්කා. ඒ අය ඉතාමත් දුක් විඳිනවා. ඒ බන්ධන කඩා ගන්න බැරිව. ඒ විදියට දුක් රාශියක් මැද්දේ ජීවත් වෙනවා දැක්කා. භාග්‍යවතුන්වහන්ස මීටත් වඩා දැඩි බන්ධන තිබෙනවාද ලෝකෙ" කියලා ඇහුවා. එතකොට බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා "මහණෙනි මොනවාද ඔය බන්ධන, ඔයිටත් වැඩිය සිය දහස් ගුණයක් වැඩි බන්ධනය තමයි ධන ධාන්‍ය අඹුදරුවන් පිළිබඳ තණ්හා වශයෙන් ඇති ක්ලේශ බන්ධනය. නමුත් එබඳු ඒ බරපතල බන්ධනය පවා අතීතයේ පුරාණ පඬිවරු සිඳලා දමලා හිමවතට ගිහිල්ලා පැවිදි දම් රැක්කා"ය කියලා ඊළඟට ජාතක කථාවක් බුදු පියාණන් වහන්සේ ඒ නිමිත්තෙන් ප්‍රකාශ කොට වදාළා.

ඉතාම බලගතු බන්ධනය හැටියට සළකන්නේ. ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං මොකද, ඒ බන්ධන කෙනෙකු පහත් ලෝක කරා ඇදගෙන යනවා. ඒ වගේම බොහොම ලිහිල් වගේ පෙනුනාට මොකද - අර හිර ගෙවල්වල හෙල්ලෙන්න බැරි විදියට බැඳපු ඒවා නොවෙයි - බොහෝ ලිහිල් වගේ පෙනෙන්නේ. ඒ කියන්නේ ඒ ගෘහ ජීවිතය සම්බන්ධ බන්ධන තියෙන කොට ඕන ඕන හැටියට ගිහිල්ලා වැඩ කටයුතු කරන්නත් පුළුවන්. නමුත් ආයෙත් ඒ ගෘහයටම එනවා. අන්න ඒ වගේ ලිහිල් නමුත් ඒකෙන් පහසුවෙන් මිදෙන්න බැරි විදියෙ - ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං එබඳු ඒ බන්ධනත් - එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති අනපෙක්ඛිනො කාම සුඛං පහාය නුවණැත්තෝ එබඳු ඒ දැඩි බලගතු බන්ධන පවා සිඳලා දමලා අපේක්ෂාවක් නැතිව කම් සුව අතහැරලා පැවිදි වුනා. ඒකයි ඒ ගාථාවල අදහස.

ඉතිං මෙතන අපට කෙටියෙන් සළකා ගන්න පුළුවන්. මේ ජාතක කථාව අර බුදු පියාණන් වහන්සේ බෝධිසත්ත්ව අවධියේ දී පිරූ නෙක්ඛම්ම පාරමිතාවට අදාළ කථාවක් බවයි පේන්නේ. නෙක්ඛම්ම කියන එක ඇත්ත වශයෙන් පැවිද්දට නියම හේතුවයි. නියම සැබෑ පැවිද්ද ඇතිවන්නේ නෙක්ඛම්මය තුළිනුයි. ඉතිං ඒ අබුද්ධෝත්පාද කාලවල පවා නෙක්ඛම්ම අදහස මුල් කරගෙන දැඩි වීර්යයකින් ඇල්ම කඩා ගන්න පුළුවන් විදියේ දැඩි ශක්තියකින්, තමයි ඒ විදියේ නෙක්ඛම්මයක් කරලා බෝධිසත්ත්වයන් වහන්සේ පැවිදි වුනෙත්. එතකොට අබුද්ධෝත්පාද කාලවල ඍෂිප්‍රව්‍රජ්‍යාව ලබන තවුසන්ට නිවන් ලබාගන්ට බෑ. ඉහළම උනොත් අර පංච අභිඥා අෂ්ට සමාපත්ති සුවයයි ලැබෙන්නේ. ඒ සුවය පිළිබඳව උදන් අනමින් තමයි අර බෝධි සත්ත්වයන් වහන්සේ අන්තිම කාලයේ ජීවත් වුනේ හිමාලයේ. නමුත් බුද්ධ ශාසනයේ පැවිද්ද ඊට වඩා උතුම් දෙයක්. පැවිදි වෙන්නෙත්, 'සබ්බදුක්ඛනිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජේථ මං භන්තෙ අනුකම්පං උපාදාය, කියල. ඒ පැවිද්ද ඉල්ලන වාක්‍යයෙන් ප්‍රකාශ කෙරෙන ආකාරයට සියලු සසර දුක් වලින් නික්මීම කියල කියන ඒ නිවන ප්‍රත්‍යක්ෂ කර ගැනීම සඳහා අනුකම්පාවෙන් පැවිදි කර වදාරනු මැනවි කියලා ඒ කරන ආයාචනය අනුවයි සිවුරු පටිය කරේ බඳින්නෙත්.

පැවිද්ද ගැන කියන කොට, නෙක්ඛම්මය ගැන කියන කොට, සාමාන්‍ය ලෝකයා හිතන්න පුළුවන් මේක පැවිද්දන්ට පමණක් අදාළ දෙයක් කියලා. නමුත් දැන් ඒ විදියේ සිතුම් පැතුම් රාශියක් සමාජයේ තියෙන නිසා අපට කියන්න වෙනවා පැවිද්දා කියන්නේ අහසින් වැටුන කෙනෙක් නොවේ. ගිහියා තුළම සිදුවන යම්කිසි ක්‍රමික විකාශයක්, සිතුවිලි පිළිබඳ

යම්කිසි පරිණාමයක් තුළිනුයි පැවිද්දෙක් ඇතිවෙන්නේ. පොතපතේ එන උපමාවක් නොවෙතත් හිතාගන්න පුළුවන් මේ පින්වතුන්ට ඇතැම් විටක ඔය වැලක කොළයක එල්ලිලා ඉන්න දළඹුවෙක් දකින්න ලැබෙනවා. ටික දවසක් යනකොට ඔය දළඹුවා පරිවර්තනය වෙනවා සමනළයෙකුට. සමනළයෙක් වෙලා බොහොම සැහැල්ලුවෙන් අල්පේච්ඡව පියාඹලා යනවා. අන්න ඒ වගේ දෙයක් තමයි ගිහියා පැවිද්දකු බවට පත්වීම. ඒ උපමාව අනුව, ඒ සංකල්පනාව අනුව, හිතාගන්න ඕන පැවිදි ජීවිතය ඈත දෙයක් නොවෙයි, අප තුළින්ම මතු වන නෙක්ඛම්මයේ ප්‍රතිඵලයක් - අවසාන ප්‍රතිඵලයක්. නෙක්ඛම්ම ශක්තියේ ප්‍රතිඵලයක්.

ඉතිං කොටින්ම කියනොත් අර අස්සාද, ආදීනව, නිස්සරණ කියලා බුදු පියාණන් වහන්සේ දක්වලා තියනවා ලෝකේ තත්ත්ව තුනක්. ලෝකයේ ආස්වාද පක්ෂයක් තියෙනවා. ඒක තියෙන නිසා තමයි ලෝක සත්ත්වයා ඇලෙන්නේ. ඒක ස්වාභාවිකයි. ඒ වගේම ආස්වාද පක්ෂයේ තියෙනවා ආදීනව කොටසක්. බුදු පියාණන් වහන්සේ දක්වනවා ආස්වාදයටත් වඩා ආදීනව දැඩියි. ඒක නිසාම තමයි ආස්වාදය පස්සේ එළවගෙන යන තැනැත්තා යම්කිසි දවසක ආදීනව දකලා කලකිරෙන්නේ. ඒකත් ස්වාභාවිකයි. ඊළඟට ආදීනව දකලා කලකිරුනාට පස්සේ යම්කිසි කෙනෙක් විමුක්තියක් හොයනවා. තමන් හිර ගෙයක බැඳිලා ඉන්නවා කියන හැඟීම තුළිනුයි ඒ විමුක්තිය සොයන්න පෙළඹෙන්නේ.

එතකොට බන්ධනාගාරයක තිබෙන බන්ධන දැඩි හැටියට පෙනුනට ඊට වඩා බරපතලයි මේ තණ්හාව වශයෙන් ඒ වස්තු සම්භාර පිළිබඳව, අඹුදරුවන් පිළිබඳව, ඇති බන්ධනය. ඒක කඩාගන්න විශාල ශක්තියක් ඇතුළතින් ඇතිකරගත යුතුව තිබෙනවා. ඉතිං ඒ විදියෙ උතුම් ශක්තියක් ඇතිකරගෙන තමයි අතීතයේ, බුද්ධ කාලයේ විශේෂයෙන්ම අපට අසන්න ලැබෙනවා පුදුම අන්දමේ බලසම්පන්න නෙක්ඛම්ම අදහසකින් යුක්තව පැවිදි වුනු කථාන්තර. රට්ඨපාල කුල පුත්‍රයා පිළිබඳව සිද්ධිය විශේෂයි. රට්ඨපාල කුල පුත්‍රයා මහා ධනවන්ත පවුලක උපන්න කෙනෙක්. භාර්යාවන් හතර දෙනෙක් හිටියා. නමුත් බුදු පියාණන් වහන්සේගෙන් එක බණක් අහලම ඇතිවුනු කලකිරීම තුළින් මාරාන්තික උපවාසයක් කරලයි මව්පියන්ගෙන් පැවිද්දට අවසර ලබාගත්තේ. ඒ වගේම ඒ ධර්ම කථා තුළින් අපට දනාගන්න ලැබෙනවා සිටුවරු, රජවරු, රජ කුමාරිකාවන්, රජ බිසෝවරුන්, සිටු දේවියන් ඒ විදියට හැම කෙනෙක්ම තමන්ගේ මහා ධනස්කන්ධ සැප සම්පත් අතහැරලා - ඒකට උපමාව අර පැරණි පොත් වල සඳහන් වෙන්නේ අලුයම ලූ කෙළ පිඩක් සේ, කෙළ පිඩ කොහොමත් එපා කරන දෙයක්. උදේ පාන්දර දාපු කෙළ පිඩක් කොහෙත්ම ගන්න

දෙයක් නෑ - ඒ වගේ අලුයම් ලූ කෙළ පිඩක් සේ සළකා ඒ වස්තු සම්භාරය අතෑරලයි පැවිදි වුනේ.

ඒ වගේම වටිනා කථාන්තරයක් තමයි කෙටියෙන් සළකනවා නම් සැරියුත් ස්වාමීන්වහන්සේගේ බාල මලණුවන් වූ රේවත කුමාරයා පිළිබඳ සිද්ධිය. සැරියුත් ස්වාමීන් වහන්සේ තමන් පැවිදි වුනා විතරක් නෙවෙයි තමන්ගේ සොහොයුරියන් තුන් දෙනෙකුත් සහෝදරයන් දෙදෙනෙකුත් පැවිදි කරවා ගත්තා. තව ගෙදර ඉතුරු වුනේ රේවත කියන පොඩි කුමාරයා විතරයි. හත් අවුරුදු වයසෙදිම මව් බැමිණිය කල්පනා කළා මේ දරුවත් අරගෙන ගිහිල්ලා පැවිදි කරයි කියලා ගෘහ බන්ධනයෙන් බඳින්න ඕන කියල ඒ වයසේම හත් අවුරුදු කුමාරිකාවක් එක්ක විවාහයක් සූදානම් කරලා එක්කගෙන ගිහිල්ලා විවාහ කළා. ආපහු එන අතරේ මගුල් රථයෙන් බැහැලා මේ කුඩා දරුවා ඒ ඇතිවුන නෙක්ඛම්ම සංකල්පය කොයිතරම් බලගතුද කියනොත් මගුල් ඇඳුම් පිටින්ම දුවලා ගිහිල්ලා, ඒ අසල පන්සලකට ගිහිල්ලා, මාව ඉක්මණට පැවිදි කරන්න කියලා ඉල්ලා සිටියා. ඒ සංඝයා වහන්සේලාත්, සැරියුත් ස්වාමීන් වහන්සේ කලින්ම අවසර දීලා තිබුන නිසා පැවිදි කළා. එහෙම පැවිදි වෙලා අන්තිමේදී රහත් වුනා. මහා අභිඥාබල සම්පන්න මහ පුදුම ප්‍රාතිහාර්ය ශක්තියක් ඇති රහතන් වහන්සේ කෙනෙක් බවට පත්වුනා.

එතකොට බුද්ධ කාලයේ ඒ විදියේ කථාන්තර අපට අසන්නට ලැබුණත් ඇතැම් බෞද්ධ රටවලින් මීට වඩා හාත්පසින්ම වෙනස් සිද්ධීන් අපට අසන්නට ලැබෙනවා. සමහර බෞද්ධ රටවල පැවිදිවීම සමාජ චාරිත්‍රයක්, සමාජ රටාවක් බවට පත්කරගෙන තියෙනවා. සංස්කෘතික ලක්ෂණයක් හැටියට රටේ කවුරු කවුරුත් පැවිදි වෙන්න ඕන කියලා. එවැනි රටක එක්තරා අවස්ථාවක තරුණයෙක් බොහොම ළහිලහියේ කලබලේට දුවගෙන ඇවිල්ලා ආරාමයකට සංඝයා වහන්සේලාගෙන් ඉල්ලා හිටියා මාව පැවිදි කරන්න කියලා. මොකද කලබලේ කියලා ඇහුවහම තරුණයා කියනවා මම විවාහ වෙන්නයි සූදානම් වෙලා ඉන්නේ. මම ජීවිතේ කවදාවත් පැවිදි වෙලා නැති නිසා, පැවිදි සහතිකය නැති නිසා, මනාලියගේ පියා විවාහයට විරුද්ධ වෙන්නයි යන්නේ. ඒක නිසා ඉක්මණට මා පැවිදි කරන්න කියලා. ඉතිං සංඝයා වහන්සේලාත් ඒ සමාජ චාරිත්‍රය ඉෂ්ට සිරීමක් වශයෙන් තරුණයා පැවිදි කළා. ඉතිං මේක අර බුද්ධ කාලයේ පැවිදි වීමේ ඒ නෙක්ඛම්ම ශක්තියත් එක්ක සංසන්දනය කරලා බලන කොට ඊට හාත්පසින්ම විරුද්ධ දෙයක්. අපේ බෞද්ධයින්ට නම් ඒක හාස්‍යජනක සිද්ධියක් හැටියට සළකන්න පුළුවන්. නමුත් දැන් සමාජයේ ඇතිවන යම් යම් සිතුම් පැතුම් අනුව ඇතැම් විට එවැනි හාස්‍යජනක සිද්ධි

නුදුරු අනාගතයේදී මේ රටෙන් වුනත් අහන්න බැරිවෙන්නේ නැහැ. මොකද, පැවිද්ද තුළ තිබෙන අර නෙක්ඛම්ම පරමාර්ථය ක්‍රමක්‍රමයෙන් දියවී යනවා. ඒ වෙනුවට මේක සමාජ රටාවක්, සංස්කෘතික අංගයක්, බවට පත්වෙනවා. බුදු පියාණන් වහන්සේ දක්වලා තියෙන පැවිද්ද ඒ කාලයේ තිබුණ සමාජ චාරිත්‍ර වලටත් වඩා පුදුම විදියේ ගැඹුරු අදහසකින් ඉදිරිපත් කරපු පැවිද්දක්. මොකද, බුදු පියාණන් වහන්සේ දක්වූවා යම්කිසි අවස්ථාවක පුද්ගලයෙකුගේ සාංසාරික බුද්ධිය මුහුකුරා ගිහිල්ලා නෙක්ඛම්ම සංකල්පය දැඩිව ඇතිවුනා නම්, සසර කලකිරීම ඇතිවෙලා, සසර බය ඇතිවෙලා, අන්න ඒ අවස්ථාවෙ වයස් භේදයක් නැතිව පැවිදි කළ යුතුයි කියලා.

ඒ නිසා තමයි හත් අවුරුදු දරුවාගේ පටන් ඉතාම වයෝවෘද්ධ මහල්ලා දක්වා මේ ශාසනයේ පැවිද්ද ලබාගෙන රහත් බව ලබාගත්තෙ. සසර දුක් කෙළවර කරගත්තෙ. ඒ හැම කෙනෙක්ම නෙක්ඛම්ම සංකල්පය මුල් කරගෙනයි ඒ පැවිද්ද ලබාගත්තෙ. සාමාන්‍ය සංස්කෘතික රටාවකට යට වෙලා නොවෙයි.

ඉතිං ඒ අනුව අපි කල්පනා කරලා බලන කොට ගිහි පින්වතා කොයි අවධියකදී හෝ ගැඹුරු නෙක්ඛම්ම අදහසකින් පැවිදි වෙනවා නම් ඒක ඉතාමත්ම වටිනා දෙයක්. බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කර තිබෙනවා. 'තිණ්ණං අඤ්ඤතරං යාමං - පටිජග්ගෙය්‍ය පණ්ඩිතො' කියල. නුවණැති පුද්ගලයා තමාගෙ ජීවිතයේ අවස්ථා තුනෙන් එක අවස්ථාවක හෝ තමා ගැන සොයා බැලිය යුතුයි කියලා. තමා ගැන සොයා බැලිය යුතුයි කියලා කියන්නේ තමාගේ විමුක්තිය පිළිබඳව. ළමා අවධියේදී බැරි වුනා නම් තරුණ අවධියේදී, තරුණ අවධියේදී බැරි වුනා නම් මහලු අවධියේදී. මහලු අවධියේදී නමුත් අර රාධ බ්‍රාහ්මණයා වගේ අවසාන අවස්ථාවේදී නමුත් පැවිදි වෙලා දැඩි උත්සාහයකින්, වීර්යයකින් භාවනා කළොත් පුළුවන් රහත් වෙන්න. එතකොට බුදු පියාණන් වහන්සේගේ ඒ දර්ශනය හින්දු දර්ශනයටත් වඩා වෙනස් දෙයක්. හින්දුන්ගෙ දර්ශනයේ ජීවිතේ අවස්ථා හතරකට බෙදලා ආශ්‍රම හතරක් හැටියට දක්වනවා. මුල් අවස්ථා දෙක ලෞකික පරමාර්ථ ඉෂ්ට කරගැනීම සඳහා යෙදිය යුතුයි අනිවාර්යයෙන්ම. අවසාන කාල දෙක පමණයි පැවිදි ජීවිතයට - ආධ්‍යාත්මික පරමාර්ථ - සඳහා යොමු කළ යුත්තේ කියලා ඒ විධියට දක්වනවා. ඒ පිළිබඳ එක්තරා ශ්ලෝකයකුත් තියෙනවා.

ශෛශවෙභ්‍යස්ත විද්‍යානාං
යෞවනෙ විෂයෛෂිණාම්
වාර්ධකෙ මුනිවෘත්තීනාම්
යොගෙනාන්තෙ තනුත්‍යජාම්

ළමා අවධියේදී විද්‍යා ශාස්ත්‍ර ඉගෙන ගත්තා වූ තරුණ අවධියේදී පස්කම් සැප සෙව්වාවූ, වෘද්ධ අවස්ථාවේදී වනයට පිවිසිලා මුනි වෘත්තියට යොමු වුනාවූ, අයගේ ජීවිතය අවසාන වන්නේ යෝග කර්ම කිරීමෙන්ය කියලයි ඒ ශ්ලෝකයෙන් දක්වෙන්නෙ.

ජීවිතේ හතර අවස්ථාවකට බෙදලා අර ළමා අවධියක්, තරුණ අවධියක් ලෞකික ඕනෑ ඵපාකම් පිරිමසා ගන්න යොදවලා අවසාන අවස්ථා ශ්‍රමණක් වනයට පිවිසීම් ආදියට යෙදිය යුතුය කියලා ඒ විදියට සමාජයක් එක්ක එක්තරා ගනුදෙනුවක් කරලා තිබෙනවා. නමුත් බෞද්ධ දර්ශනයේ බුදු පියාණන් වහන්සේ අපට පෙන්නුම් කරන්නේ මාරයාත් එක්ක ගනුදෙනුවක් බැරිය කියලයි. අප්‍රමාද පදය සිහිගන්වනවා. ඒ විදියට ජීවිතය කොටස් හතරකට බෙදාගෙන අවසාන කාලයේ පැවිදි වෙනවා කියලා එහෙම ස්ථිරව නිගමනයක් කරගෙන ජීවත් වීම සමහර විට අවදානම් දෙයක්. ඒක නිසා තමයි එකම සුදුසුකම - පැවිදි වීම පිළිබඳව තව නොයෙකුත් විනයට අදාළ යම් යම් දේ තිබෙනවා - නමුත් ගැඹුරින් බැලුවහම නියම සුදුසුකම අන්න අර කියාපු නෙක්ඛම්ම සංකල්පය මතු වීමයි. සංවේග වස්තු වශයෙන් ඒ ජීවිතේ තත්ත්වය ගැන කල්පනා කරලා ආස්වාද පක්ෂය තුළින් මතුවන ආදීනව ගැන හිතලා නිස්සරණය කියලා කියන භවයෙන් නික්මීම පිළිබඳ අදහස යම් කෙනෙකු තුළ ඇතිවුනා නම් අන්න ඒ අවධියේ ඒ පුද්ගලයාට වයස් භේදයක් නැතිව පැවිදි වීමට බුදුරජාණන් වහන්සේ ඉඩ දුන්නා.

එතකොට ඒක අපි තේරුම් ගන්න ඕන. මොකද මේ නෙක්ඛම්මය කියන එක සමාජ රටාවක්, විලාසිතාවක්, බවට පත්වුනාට පස්සේ මේකෙ ඇති ශක්තිය නැතිවෙනවා. මේකෙ වටිනාකම නැතිවෙනවා. කොටින්ම කියනොත් පැවිද්ද කියන එක අවතක්සේරුවට පත්වෙනවා. මේ කාලයේ වචනයෙන් කියනවා නම්, පැවිද්ද කියන එක - ප්‍රව්‍රජ්‍යාව - අවතක්සේරුවට පත්වෙනවා, අර විදියේ සමාජ රටාවක් කරගෙන ලෞකික පරමාර්ථ ඉෂ්ට කරගන්න සහතිකයක් ගැනීම සඳහා පැවිදි වුනොත්. ඒක අපි මතක් කරගත යුතුව තියෙනවා. සමහර විට ඇතැම් කෙනෙක් මේ බෞද්ධ රටවල් කියලා ආදර්ශයට ගන්නවා. නමුත් ඇත්ත වශයෙන්ම අපි ආදර්ශයට ගත යුත්තේ බුද්ධ කාලයයි. බුද්ධ කාලයේ නියම පැවිද්ද අන්න අර විදියට ගැඹුරු නෙක්ඛම්ම සංකල්පයකින්. යම්කිසි විදියකින් ඒක කරගන්න බැරි වුනොත් සිවුරු හැර යාමට ඉඩ තියෙනවා. ඒ කාරණය ඇත්ත. නමුත් ඒක පවා බුදු පියාණන් වහන්සේ දක්වනවා, ශාසනික වටිනාකම් දක්වීමේදී, යම් කෙනෙක් පැවිදි වෙන්නෙ - එතන දක්වෙන්නේ සුළු වූ හෝ වස්තු සම්භාරයක් අත්හැරලා මහත් වූ හෝ වස්තු සම්භාරයක් අතහැරලා, සුළු

වූ හෝ නෑ පිරිසක් අත්හැරලා මහත් වූ හෝ නෑ පිරිසක් අත්හැරලා ඒ විදියේ මහා ශ්‍රේෂ්ඨ සංකල්පයකින් යුක්තව, අත්හැරීම පිළිබඳ නෙක්ඛම්ම සංකල්පයකින් යුක්තවයි කෙනෙක් පැවිදි වෙන්නේ.

එහෙම පැවිදි වෙලා යම්කිසි හේතුවක් නිසා පැවිද්ද කරගන්න බැරිව සිවුරු හැරියොත් ඒ පුද්ගලයා පිළිබඳව බුදු පියාණන් වහන්සේ දක්වන වටිනාකම මේ විදියටයි. මහණෙනි, මේ ආර්ය විනයේ ආර්ය ව්‍යවහාරයට අනුව, ඒ විදියට සිවුරු ඇරලා උපැවිදි වීම එහෙම නැත්නම් සිවුරු හැරයාම මේ ශාසනයේ මරණය වගේ. මේ ශාසනයේ අර්ථයෙන් බලන කොට ඒක මළා වගෙයි. කෙනෙක් මළා වගෙයි සිවුරු හැරියා කියන එක. ඉතිං එහෙම නමුත්, අපි ඒ විදියට කිව්වාට මොකද අර කියාපු විදියට සංස්කෘතික අංගයක් බවට, සමාජ රටාවක් බවට, සැහැල්ලු දෙයක් බවට, මේක පත්වුනොත් කෙනෙකුට පුළුවන් මරණ වරෙන්තුව අත්සන් කරලාම පැවිදි වෙන්න. ඒ කියන්නේ අර කියාපු නියම පරමාර්ථය නොවේ. පැවිදි පරමාර්ථය පිළිබඳව අපි කලින් කියාපු වාක්‍යයයි ඒ අතීතයේ ඉඳන් පවතින්නේ. නමුත් අපට කියන්න බැහැ නුදුරු අනාගතයේදී පැවිදි වාක්‍යය පිළිබඳව කාලානුරූප සංශෝධනයක් පවා ඇතැම් විට කෙරෙන්න ඉඩ තිබෙනවා. පැවිදි පරමාර්ථයෙන් ඉවත් වෙන්න ඉවත් වෙන්න, අර කියාපු සබ්බ දුක්ඛ නිස්සරණ අදහස යල් පැනපු එකක් හැටියට සළකලා සමාජ ව්‍යුහයට ගැලපෙන ආකාරයට, දත් යන රැල්ලට ගැලපෙන ආකාරයට, පැවිද්දේ පරමාර්ථ පවා ඇතැම් විට වෙනස් වෙන්නට ඉඩ තියෙනවා. නමුත් ඊට කලින් අපට කියන්න තියෙන්නේ මෙන්න මෙච්චරයි. ඔය පැවිද්ද කියන එක අර විදියට ගැඹුරු අදහසකින් වුනොත් තමයි ශාසනයක් ආරක්ෂා වෙන්නේ. මොකද මේ ශාසනයේ මුදුන් මල්කඩ වැනි දෙයක් තමයි පැවිදි සංකල්පය. කෙනෙකුගේ අර කියාපු මෝරා යාමෙන් - අපි ටිකක් හිතලා බලමු, අර උපමාව අනුව දළඹුවා වගේ අර විදියට කොළේ වැලේ එල්ලිලා හිටපු පුද්ගලයා ඊළඟට මේ සියල්ල අතහැරලා සමනළයා වගේ පියාඹලා යනවා. ඒ වගේ ඒ බැඳුම් අතහැරලා අල්පේච්ඡතාවට යොමු වෙලා, සැහැල්ලු පැවතුම පැවිද්ද වශයෙන් හඳුන්වනවා.

අන්න ඒ විදියට අපි මේ උපමාවෙන් මතක් කරන්නේ මේ පුද්ගලයා ඇතුළත යම්කිසි පරිණාමයක් වෙන්න ඕන. විකාශයක් වෙන්න ඕන. එහෙම නැතිව බාහිරව කෙරෙන දෙයක් නොවෙයි. බාහිරව ඇඳුම් ආයිත්තම් හිස මුඩු කිරීම් පමණකින් කෙනෙක් පැවිදි නොවෙන බව බුදු පියාණන් වහන්සේ කොතෙකුත් මතක් කරලා දීලා තිබෙනවා.

ඉතිං මෙන්න මේ කාරණා ගැන කල්පනා කරලා බලන කොට, නෙක්ඛම්මය කියන එක ගිහි හෝ වේවා, පැවිදි හෝ වේවා, හැම කෙනෙකු තුළම ක්‍රම ක්‍රමයෙන් වැඩී දියුණු විය යුතු දෙයක්. දැන් බෝධිසත්ත්වයන් වහන්සේ පිළිබඳ මේ කථාවෙන් කියවුනු ආකාරයට අපට පේනවා අති දීර්ඝ කාලයක් නෙක්ඛම්ම පාරමිතා වශයෙන් මේ සියාදු නෙක්ඛම්මය කළා කියලා. ඉතිං මෙතන මේ සියාදු කථාන්තරයෙ තිබෙන්නේ අර බෝධි සත්ත්වයාණන් වහන්සේ අවසානයේ බුද්ධත්වය ලබන ආත්ම භාවයේදී සිද්ධාර්ථ කුමාරයා හැටියට ඒ රාහුල කුමාරයා උපන් දවසේම රජ ගෙදරින් පිටවෙලා යාමේ සිද්ධියට පෙරහුරුවක් වශයෙන් ඒ අතීතයේ කළ නෙක්ඛම්මය. මේ කථාන්තරයෙන් කියවුන නෙක්ඛම්මය. ඒ වගේ අපි කල්පනා කළ යුතුයි. අපි අති දීර්ඝ කාලයක් මේ සංසාරේ ඉන්න අතරේ ආස්වාද මස්සේ දුවලා කොයෙකුත් අවස්ථා වල ඒවායේ ආදීනව දැකලා මේ විදියෙ නෙක්ඛම්ම කරන්නත් ඇති. ඒ නෙක්ඛම්ම ශක්තියක් අප තුළ තියෙනව දැන් කොයි අන්දමින් ගිහි ජීවිතේ ගෙවුවත්. ඒක නිසා අපි හිතන්න ඕන. අපි 'හැකි සංඥාව' ඇති කරගන්න ඕන. ඇතුළතින් අපි ඒ ශක්තිය මතු කර ගන්න ඕන. එහෙම නැතුව බාහිරව මේක අරෝපණය කිරීමක්, සංස්කෘතික රටාවක් කරගැනීමක්, සමාජ රටාවකටම වහල් වීමක් නොවෙයි. පැවිද්ද කියන එක ඇතුළතින් ආ යුතු දෙයක්. ඒකට අවශ්‍ය ආකාරයට ධර්මය වශයෙන් අපි පෝෂණය ලබන්න ඕන. බෞද්ධ පින්වතුන්ට සංවේග වස්තු ගැන නිතර මෙනෙහි කරන්න කියලා තියෙන්නේ ජාති, ජරා, ව්‍යාධි, අපාය දුක්, ඊළඟට අතීතයේ විඳින ලද සංසාර දුක්, අනාගතයේ විඳින්න වෙන සංසාර දුක්, වෙන එකක් තබා ආහාර සෙවීම. වර්තමානයේ ආහාර සෙවීම සඳහා විඳින්න වෙන දුක, ඒකම ඇති ගිහි පින්වතුන්ට සසර කළකිරෙන්න.

දැන් කාලේ දවසක් ගතකරන්නේ මේ බඩ වියත සඳහා නේද? ඉතිං ඒ විදියේ දේවල් ගැන කල්පනා කරලා පවා නියම අන්දමින් ඒ නෙක්ඛම්මය මතුකරගෙන ඒ දුගී පුද්ගලයින් - කුල භේද පිළිබඳ ප්‍රශ්නයක් නැහැ මේ ශාසනයේ - එබඳු පුද්ගලයින් පවා යන්තම් අමුඩ කෑල්ල විතරක් තියෙන අය පවා, බුදු පියාණන් වහන්සේ ළඟට, ශ්‍රාවකයන් වහන්සේලා ළඟට ඇවිල්ලා තමන්ගේ නෙක්ඛම්ම සංකල්පය තේරුම් කරලා දීලා පැවිදි වෙලා රහත් වුන අවස්ථා තිබෙනවා.

අන්න ඒක නිසා අපි කවුරුත් හිතන්න ඕන අර කියාදු අස්සාද ආදීනව නිස්සරණ කියන ඒ අත්දැකීම් මේ දීර්ඝ සංසාරයේ අපි කොයෙකුත් විඳින්න ඇති. ඉතිං දැන් කොයි අතට නැඹුරු වෙලා හිටියත් අපි උත්සාහ කරනවා නම් ධර්මානුකූලව, අපි පෝෂණය කරනවා නම් අන්න අර

නෙක්ඛම්ම පැත්ත, - නෙක්ඛම්ම සංකල්පය - අපට, යම්කිසි අවස්ථාවක අර කියාපු ජීවිතයේ අවසාන අවස්ථාවෙ හෝ පුළුවනි. යම්කිසි කෙනෙක් අපි හිතමු මුල් අවස්ථාවේ බැරිවුනා, තරුණ අවස්ථාවේත් බැරිවුනා නමුත් අවසාන අවස්ථාවේ, වයෝවෘද්ධ අවස්ථාවේ, තමන්ගේ අඹුදරුවන්ගෙන් නෑ හිතවතුන්ගෙන් සමු අරගෙන, නිලකල ධනධාන්‍ය වස්තු සම්භාර අර කියාපු විදියට අලුයම ලූ කෙළ පිඩක් සේ ප්‍රතික්ෂේප කරලා පැවිදි වෙනවා නම් ඒක උතුම්ම පැවිද්දක්. ශ්‍රේෂ්ඨ පැවිද්දක්. අවසාන අවස්ථාවේ සළ නමුත්, අන්න ඒ විදියේ පැවිද්දකින් නමුත්, කෙනෙකුට අප්‍රමාදය තිබෙනවා නම්, අප්‍රමාද පදය අනුව ක්‍රියාකරනවා නම්, මේ සංසාර විමුක්තිය ලබන්න පුළුවන්.

දැන් මේ බොහෝ දෙනා නිතර කියනවා අපට ඇහෙනවා - ගිහි පින්වතුන්, අපව හොයාගෙන එන අය - මේ මේ බන්ධන නැත්නම් මම කොහොම හරි පැවිදි වෙනවා, කියලා. ඒ තරමට පැවිදි සංකල්පය තිබෙන අය අපට කොහෙකුත් ඇවිල්ලා කියනවා. ඒවා අවංකවම කියනවා වෙන්න පුළුවන්. ඒ ඒ අයගේ තත්ත්වය අනුව අවංකවම කියන දෙයක්. නමුත් අර හේතුව තමයි බුදු පියාණන් වහන්සේ දක්වන්නේ මේ බන්ධනය ඉතාම සියුම්. අර බන්ධනාගාරයේ බන්ධනයට වඩා ඉතාම සියුම් බන්ධනයක් මේක. බන්ධනාගාරයේ බන්ධන වලින් හෙල්ලෙන්න බැහැ. දැන් මෙතන මේ බන්ධන වලින් හෙල්ලෙන්න විතරක් නොවේ. ඕනෑ ඇතකට ගිහිල්ලා, දුරු රටකට ගිහිල්ලා රස්සාවල් කරලා ධනය උපයන්නත් පුළුවන්. හැබැයි ආපහු එන්න ඕන. අර බන්ධනයෙ ස්වභාවය ඒකයි.

ඒකයි බුදු පියාණන් වහන්සේ 'සිථිලං දුප්පමුඤ්චං' කිව්වෙ. ලිහිල් වගේ පෙනුනත් මේක පහසුවෙන් කඩාගන්න බැරි බන්ධනයක්. නමුත් අපි හිතමු යම්කිසි කෙනෙක් ඇත්ත වශයෙන්ම අර විදියට ඇතුළතින් හදවත තුළින් නෙක්ඛම්මය, පැවිද්ද, ප්‍රාර්ථනා කරමින් හිටියා. මොනයම් හේතුවකින් හෝ පැවිදි වෙන්න බැරිවුනා. ඒ පුද්ගලයාගේ අවසාන අවස්ථාව ගැන අපි හිතලා බලමු. තමාගේ අඹුදරුවන්, ඒ ඔක්කෝම පිරිවරාගෙන අඬ අඬා ඉන්න අතරේ මේ තැනැත්තාට පුළුවන් තමාගේ චිත්ත සන්තානයෙ, හද පත්ලේ, අර දියුණු කරගත්තු නෙක්ඛම්ම සංකල්පය මතු කරගෙන, පැවිදි වෙන්න හිටපු ඒ පැවිදි රූපය හිතට නගාගෙන යම්කිසි සහනයක් ලබාගන්න. අර කියාපු බැඳුම් වලින් ඉවත් වෙලා හොඳ උත්පත්තියක් ලබන්න හේතුවන යම්කිසි තාවකාලික සැනසීමක් ඒ තැනැත්තාට ඇති කරගන්න පුළුවන්. මොකද බුදු පියාණන් වහන්සේ ඔහාරිනං කියලා කිව්වෙ, පහළට ඇදලා දානවා කියලා කිව්වේ මොකද. අර කියාපු තණ්හාවල් නිසා අවසාන අවස්ථාවේ ඒ තණ්හාවල් ඉදිරිපත් වුනාම, ඒ

ගිජුකම ඉදිරිපත් වුනාම, ඒ තැනැත්තන් තමතමන්ගේ පවුල් ආශ්‍රිතව, ස්ථාන ආශ්‍රිතව, ප්‍රේතයින් හැටියට, තිරිසනුන් හැටියට උත්පත්තිය ලබනවා. ඒ ඇල්ම නිසාම. යක්ෂයින් හැටියට සමහර විට දෘෂ්ටි දාගෙන ඉන්න බව මේ කාලයේ අසන්නට ලැබෙනවා. අන්න ඒ විදියේ තත්ත්වයක් තිබෙනවා මේ තණ්හා බන්ධනයේ, ක්ලේශ බන්ධනයේ.

ආර්ය අෂ්ටාංගික මාර්ගය ගිහි පැවිදි දෙපක්ෂයටම අයිති ශික්ෂා මාර්ගයක් නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙ සම්මා සංකල්පය යටතේ තියෙන්නේ නෙක්ඛම්ම සංකප්ප අව්‍යාපාද සංකප්ප අවිහිංසා සංකප්ප. ගිහි පුද්ගලයාත් නෙක්ඛම්ම සංකප්ප දියුණු කරගත යුතුයි. ක්‍රමානුකූලව නිරන්තරයෙන් මේ ජීවිතයේ යථාතත්ත්වය ගැන නුවණින් කල්පනා කරලා -වෙන දේකින් නොවෙයි වෙන අස්වාභාවික ක්‍රමයකින් නොවෙයි - ස්වාභාවිකවම සංසාර දුක් ස්වභාවය අවට වෙන සිද්ධි වලින් තමන්ගේ ජීවිතයේ අර සියාපු ජාති, ජරා ව්‍යාධි ආදී තත්ත්ව වලින්, ඒවා ගැන කල්පනා කරලා, බුද්ධ වචනයේ සත්‍ය ස්වභාවය තේරුම් අරගෙන "යම්කිසි දවසක මට පැවිදි වෙන්නට ඇත්නම් හොඳයි" කියලා අප්‍රමාදීව ඒක ක්‍රියාත්මක කරනවා නම් ඒ තරමට හොඳයි. අපි අර කිව්වේ යම්කිසි විදියකින් බැරි වුනත් ඒ තැනැත්තාට අවසාන අවස්ථාවේදී යම්කිසි සැනසීමක් තියෙනවා අර නෙක්ඛම්ම සංකල්පය ගැන කොහෙත්ම නොහිතා හිටපු කට්ටියට වැඩිය. නෙක්ඛම්ම සංකල්පය පැවිද්දන්ට විතරක් භාරදීලා ගිහියන් වන අපට අයිති ආර්ජීකය නගාසිටුවන එකයි කියලා යම්කිසි කෙනෙක් හිතාගෙන ජීවත් වුනොත් ඒ තැනැත්තාට වෙන්නේ අර දැඩි තණ්හාව අතහරින්න වෙන වෙලාවේ, මාරයා ඇවිල්ලා අදින වෙලාවේ, මාරයා දොරට තට්ටු කරන වෙලාවේ, අඬාගෙන, වැලපීගෙන අරවාට ගිජුව, ගිජුකම් ඇතිව, මැරිලා ගිහිල්ලා අන්තිමට තිරිසනුන් වෙලා, ගෙදරවල් වලම ගැවසෙන්න. එහෙම නැත්නම් ප්‍රේත ආදී ආත්ම භාව ලබනවා. ඔය විදියේ භයානක තත්ත්වයක් සංසාරයේ තිබෙන නිසා. මේ ගිහි පින්වතුන්ට විතරක් එල්ල කරලා කිවුවා කියලා හිතන්න එපා. දන් කල යන හැටියට සමහර විට මේක පැවිදි පින්වතුන්ටත් ගැලපෙන දෙයක් වෙන්න පුළුවන්. කොයියම් ආකාරයකින් හෝ ඒ තමතමන්ගේ නිලතල, ධනධාන්‍ය, වතුපිටි, ඉඩකඩම් පිළිබඳව ඇල්ම ඇතිව මිය ගියොත් ඒ තැනැත්තාගේ ඊළඟ ආත්ම භාවය හොඳ එකක් නොවන බව බුදු පියාණන් වහන්සේ දක්වලා තියෙනවා. හැකිතාක් දුරට මේවායින් හිත මුදා කරගෙන මිය පරලොව ගියොත් ඒ තැනැත්තාට සැනසිලිදායක තත්ත්වයක් ලබාගන්න පුළුවන්. ඉතිං මෙන්න මේ විදියට කල්පනා කරලා බලන කොට අර බන්ධනාගාරයේ බන්ධන ගැන හිතන කොට ඒ බන්ධන කවුරුවත් අල්ලලා බඳින බැඳුමක්.

මෙතන තියෙන්නේ කවුරුවත් අල්ලලා බැඳීමක් නොවේ. ඇතුළතින් කෙරෙන බැඳීමක්. මේ බැඳීමට හේතුවන්නේ ඒක කෙටියෙන් කියනවා නම් - මේ තණ්හාවයි. "උපාදානය" කියන වචනයක් තියෙනවා. උපාදානය කියන්නේ අල්ලා ගැනීම. ඒ අල්ලා ගැනීම එක්කම යනවා රැස් කිරීම. දැන් ගිහි පින්වතුන් ඒක හොඳට දන්නවා. අල්ලා ගැනීමක් කියන්නේ යම්කිසි බන්ධනයක් නිසා, තමන්ගේ තණ්හාවෙන් ඇති කරගත්තු අල්ලා ගැනීම නිසා ඊට පස්සේ රැස් කිරීම් - වස්තු සම්භාර රැස් කරන්න සිද්ධ වෙනවා. ඉතිං පිටතට බන්ධනයක් හැටියට නොපෙනුනත් ඒ බන්ධනයේ හිරවෙලා හිටියොත් මාරයා ආ වෙලාවට තමන්ට කරකියා ගන්ට දෙයක් නැතිවෙනවා.

අපි මේකටත් යම්කිසි උපමාවක් ගනිමු. දැන් සමහර ප්‍රදේශවල, සමහර රටවල්වල, රිළවු අල්ලන උපක්‍රමයක් තියෙනවා. කඹ ආදී මොකුත් වත් අවශ්‍ය නැහැ. බොහොම සුළු දෙයයි කරන්න තියෙන්නේ. කුරුම්බාවක් අරගෙන - නැඹිලි ගෙඩියක් හරි කමක් නෑ - පොඩි සිදුරක් හදනවා. හදලා රිළවු ඉන්න තැනකට දානවා. ඉතිං අර රිළවෙක් ඇවිල්ලා ඔය සිදුරෙන් ඇතුළට අත දානවා. අත දාලා කුරුම්බා ලොඳ ටික එකතු කරගන්නවා. හොඳට එකතු කරගෙන අත එළියට ගන්න බලනවා. පුළුවන් ද? කුරුම්බා ලොඳ ටික අතහරින්න කැමතිත් නෑ. අත එළියට ගන්නත් ඕනෑ. මේක කරන්න බැහැ. ඒ දඟල දඟල ඉන්න අතරේ අර මිනිහා ඇවිල්ලා ඉතිං එක්කෝ රිළවා ඕන හැටියට නටවනවා එහෙම නැත්නම් මරණවා. ඔන්න ඔය විදියේ දෙයක් තමයි අල්ලා ගැනීම තුළින් ඇතිවෙන උපාදානයත් රැස්කිරීමත්. මේවා නිසා කෙනෙකුට ඇතිවන විපාක. ඔය රිළවාට වුනු දේම තමයි වෙන්නේ යම් කිසි කෙනෙක් අර විදියට එකතු කරගෙන ඒවත් අරගෙන යන්න සූදානම් වෙනවා නම්. ඒ තැනැත්තාගේ සිත ගිජුකම ලෝභ කම නිසා කෙලෙසිලා නරක තත්ත්වවල උත්පත්ති ලබනවා. කොටින්ම කියනොත් මාරයාට අහුවෙනවා.

ගැඹුරින් කල්පනා කරලා බලනව නම් මේ කියාපු රිළවාගේ උපමාව අර සක්කාය දිට්ඨිය කියන ධර්මය තේරුම් කිරීමටත් උපකාර කරගන්න පුළුවන්. සක්කාය දිට්ඨිය කියල කියන්නේ. පින්වතුනි, පෘථග්ජන පුද්ගලයින් පිළිබඳව බුදු පියාණන් වහන්සේ දක්වනවා හැම කෙනෙකු තුළම රූප, වේදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ කියන ගොඩවල් පහක් මේ සංසාරයේ එකතු කරගෙන තියෙනවාය, ඒ එක එකක් මමය මාගේය කියලා අල්ලාගෙන ඉන්නවාය කියලා. ඒකත් හරියට අර රිළවාට කුරුම්බාව දම්ම හැටියේ මට උදව් කරන කෙනෙක් කියලා කුරුම්බාවේ අත දම්මා වගේ 'රූපය මම' කියලා කියනවා. ඒක අතහරින්න කැමති නැහැ.

එස්සෙර් 'රූපය මම' එහෙම නැත්නම් 'රූපය තුළ මා ඉන්නවා' එහෙම නැත්නම් 'මා තුළ රූපය තියෙනවා'. එහෙමත් නැත්නම් 'මම රූපවන්ත කෙනෙක්'. ඔය විදියට හතර ආකාරයකින් මේ කියාපු ස්කන්ධ පහ, ගොඩවල් පහ, පෘථග්ජන පුද්ගලයා ග්‍රහණය කරගෙන ඉන්නවාය කියලා බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළා. ඒකයි සක්කාය දිට්ඨිය කියලා කියන්නේ. ඒකත් අර අතහරින්න අකැමැත්ත. අර රිලවා එකතු කරගත්තු, රැස්කරගත්තු ලොඳ ටික අතහරින්න කැමතිත් නැහැ. අත එළියට ගන්නත් ඕන. මේ දෙකම එකට කරන්න බැහැ. ඒකයි බුදු පියාණන් වහන්සේ 'අත හැරීම' ගැන ප්‍රකාශ කරන්නේ. ගිහි හෝ වේවා, පැවිදි හෝ වේවා, අත හැරීම 'වාග' කියලා පටන් ගන්න ඒ ගුණයෙ අවසාන කෙළවර, අවසාන ප්‍රතිඵලය, අර ඇතුළතින් ඇතිවෙන නෙක්ඛම්ම ශක්තිය. අතීතයේ පවා ඒ ජාතක කතා වල තිබෙනවා දන්දීම නිසාම බෝධිසත්ත්වයන් වහන්සේ සමහරවිට ඊළඟ ආත්මයේ උත්පත්තිය ලබනවා මහා ධන සම්භාරයක් ඇති යම්කිසි කුලයක. එතකොට මේ ඔක්කෝම දන්දීලා ඉවර වෙලා මම පැවිදි වෙන්න ඕන කියලා හිතුවොත් ඒක කරගන්න සෑහෙන කාලයක් යනවා. දාන ශාලා හදලා දුන්නත් ඒක කෙළවර කරන්න බැහැ. ඉතිං එවැනි අවස්ථාවල මොකද කරන්නෙ? අර දොර දන් දෙනවා කියන්නේ 'ඕන කෙනෙක් ඕන පමණට ඇවිල්ලා ගන්න' කියලා දොරවල් ඇරලා දාලා, භාණ්ඩාගාරය ඇරලා හිමවතට ගිහිල්ලා පැවිදි වෙනවා. අන්න නෙක්ඛම්මය. එතකොට අර දානයෙන් පරිත්‍යාගයෙන් පටන්ගත්තු එකේ අවසාන ශක්තියයි නෙක්ඛම්මය කියලා කියන්නේ - නික්මීම - පංචකාම සම්පත්තියෙන් නික්මීමත් ඊළඟට ගිහිගෙන් නික්මීමත්. ඒකයි මේ නෙක්ඛම්ම කියන වචනයේ තේරුම. ඒ තරම් මහා පුදුම සංකල්පයක්. ඒක ඇතුළතින් ගොඩනගා ගත යුතු එකක් නිසාම තමයි අර ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංගයක් හැටියටත් බුදු පියාණන් වහන්සේ දක්වලා තියෙන්නේ.

එතකොට අපි මේ කිව්වෙ ධර්ම කථා ආශ්‍රයෙන්. දැන් අපි බලමු අපේ එදිනෙදා ජීවිතය ගැන. ගිහි පින්වතුන් මේකට අදාළ දේවල් කරනවා. නමුත් ඒක නෙක්ඛම්මය බව වත් ඇතැම් කෙනෙක් නුවණින් කල්පනා කරන්නේ නැහැ. දැන් මේ පින්වතුන් බොහෝ දෙනෙක් සිල් සමාදන් වෙලා ඉන්නේ. ගිහියාට ඇත්තවශයෙන්ම අයිති නිත්‍ය ශීලය හැටියට තියෙන්නේ පංච ශීලයයි. නමුත් ඊට අමතරව පොහොය දවසේ පොහොය අටසිල් රැකීම තුළ තියෙන්නේ මෙන්න මේ නෙක්ඛම්ම සංකල්පයයි. ටිකක් හිතලා බලන කොට පේනවා පොහොය අටසිල් රැකීමේදී අමුතු ශික්ෂා පද හැටියට තිබෙන්නේ පළමුවෙන්ම අර තුන්වෙනි ශික්ෂා පදය පිළිබඳව ගිහි සැපයට අදාළ කාම සම්පත් දවසකට හෝ ඒවායින් නිවාඩුවක් අරගෙන

අබ්‍රහ්මචරියාවෙන් වැළකීම. බ්‍රහ්මචරියාව රැකීමයි ඒ කියන්නේ, ශාසන බ්‍රහ්මචරියාවට ළං වීමයි. එක දවසක් හෝ ඒ රහතන් වහන්සේලාගේ ජීවිතයට ළංව ජීවත්වෙමි කියන අදහසිනුයි අතීතයේ ඉඳලාම පොහොය අටසිල් රකින්නේ. එතකොට ඒ බ්‍රහ්මචරියාව. ඊළඟට ඒවගේම විකාල භෝජනයෙන් වැළකීම, නැටුම් ගැයුම් ආදියෙන් වැළකීම, මල් ගඳ විලවුන් පාවිච්චියෙන් වැළකීම, ආභරණ දැරීමෙන් වැළකීම, උස් අසුන් ප්‍රතික්ෂේප කිරීම ඒ හැම එකක් තුළින්ම අපට පෙනෙන්නේ ගිහියා ක්‍රමක්‍රමයෙන් නෙක්ඛම්මයට සූදානම් වීමක්, හැඩගැසීමක්. මේක පැවිද්දාට පමණක් අයිති එකක් හැටියට නෙවෙයි. අන්න අර කුරුම්බා උපමාවම ගත්තොත් මෙතන කරන්නේ දීර්ඝ කාලයක් තමන් පුරුදු කරගෙන ආපු අල්ලා ගැනීමත් රැස් කිරීමත් වෙනුවට අතහැරීමත්, අස් කිරීමත් පුරුදු කිරීමයි. අන්න ඒක තුළින්ම තමයි යම්කිසි කෙනෙකුට සාංසාරික විමුක්තිය ලබාගන්න පුළුවන් වෙන්නේ. ඒක ඉලක්ක කරගෙනයි එතකොට මේ උපෝසථ අට්ඨංග සීලය.

එයිනුත් පියවරක් ඉදිරියට තියලයි අර ගෘහස්ථ දශ ශීලය වශයෙන් දක්වන්නේ. ඇතැම් කෙනෙක් ඒකත් සමාදන් වෙනවා. ඒක සමාදන් වුනාට මදි. ඒක රකින්නත් උත්සාහවන්ත වෙන්න ඕන. මොකද ඒ ශික්ෂා පදයත් දන් බොහොම ඉක්මණින්ම යල් පැනපු තත්වයකට පත්වන දෙයක්. ජාත රූප රජත පටිග්ගණ කියලා කියන එක. මුදල් පරිහරණය කියන එක. ඒක ගැන වැඩිය නොකිව්වාට මේ පින්වතුන් දන්නවා ඒක ගැන. ඇත්ත වශයෙන් ගිහි පින්වතාගේ ජීවිතය එහෙම පිටින්ම මිල මුදල් හා බැඳුන එකක්. අය වැය ලේඛනය තියේ හැමතිස්සේම. මේක කරන්නේ කොහොමද? මේකට ධනය උපයා ගන්නේ කොහොමද? මුළු මහත් ජීවිතයම ගෙවන්නේ මේ මිල මුදල් එක්කමයි. ඒ සඳහාමයි හැම කපටිකමක්ම, දරුණු ක්‍රියාවක්ම, අපරාධයක් පවා කරන්නේ. ඒ තරම් භයානක දෙයක් මේ මුදල කියන එක. ඉතිං ඒ විදියේ භයානක දේකින් හිතත්, අතත් මුදාගෙන එක දවසක් හරි ජීවත් වෙන්න පුළුවන් නම්, ඒ ශික්ෂා පදය හිතට එකඟව රකින්න පුළුවන් නම් ගිහි පින්වතාට, ඒක විශාල සහනයක්. ඒ පින්වතාට භාවනාවට හිත යොමු කරන්න පුළුවන් අර ගෙදර දොරේ තියෙන ඒ අඩුපාඩුකම් ගැන, අය වැය ලේඛනය ගැන, හිතන්නේ නැතුව. ඒ අවස්ථාවේ වත් හිත එයින් මෑත් කරගෙන බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළ ආකාරයට රහතන් වහන්සේගේ ජීවිතයට ළංව. අර සමනළයාගේ ජීවිතයට ළංව. අන්න ඒ විදියේ නිස්කලංක පැවැත්මක් ගෙනියන්න පුළුවන් භාවනාවට ඒ ශීලයත් උපකාර කරගෙන. ඒකයි ගෘහස්ථ දශ ශීලය කියලා කියන්නේ.

එතකොට අපි කල්පනා කරන්න ඕන ගිහියා එහෙම පිටින්ම වෙනම දෙපාර්තමේන්තුවක ඉන්න කෙනෙක් හැටියට නෙවෙයි. සංඝයා වහන්සේලා - පැවිද්දන් - කියන අය වෙනමම අහසින් වැටුන පක්ෂයක් නෙවෙයි. ගිහියා තුළ යම්කිසි විකාශයක් සිදුවෙනවා. ඒක ඇතුළතින් විය යුතු විකාශයක්. බාහිරින් ආරෝපණය කරන දෙයක් නොවෙයි ඒක. ඉලක්කම් ගණනට කෙරෙන පැවිදි කිරීමකුත් නොවෙයි මේක. මේක විලාසිතාවක් වුනොත් පැවිද්දේ ගරුත්වය පිරිහෙනවා. අර අබුද්ධෝත්පාද කාල වල පවා අර තරම් ශ්‍රේෂ්ඨ විදියට පැවිදි වෙලා උදන් ඇනීමට, ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කිරීමට, හැකි වුනා නම් බුද්ධෝත්පාද කාලයේ නියම නෙක්ඛම්ම අදහසකින් පැවිදි වුනොත් ඒ තැනැත්තාට නියම ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කරන්න පුළුවන් තත්ත්වයක් ලබාගන්න පුළුවනි අප්‍රමාදීව ඒ මාර්ගයේ ගමන් කළොත්. නමුත් ඒ මාර්ගයෙන් පිට පැනලා, අර පරමාර්ථ අමතක කරලා, නෙක්ඛම්මය 'නිකම්ම පැවිද්දක්' කරගත්තොත් - නෙක්ඛම්ම පැවිද්ද - සමහර පාලි වචන අමාරු නිසාදෝ සමහරු ඒක 'නිකම්ම පැවිද්දක්' කරගන්නවා. ඉතිං නිකම්ම පැවිද්දක් වුනොත් ඒකේ කිසි ආනිසංසයක් බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ තුළින් වෙන්නේ ශාසන පරිහානියක්. මොකද ශාසනයේ තියෙන වටිනාකම් අවතක්සේරුවට ලක් කිරීමක්.

අන්න ඒ නිසා ගිහි පින්වතුන් හොඳින්, නුවණින්, කල්පනා කරන්න ඕන. නොයෙකුත් විදියට ඒ පිටරටවල් වල තිබෙන දේවල් සමහර විට අපි ආරෝපණය කරගන්නවා, ඒවායේ වටිනාකම් ගැන හිතන්නේ නැතුව. බොහෝ විට මෑත ඉතිහාසයේ ඒ ඒ රටවල් වල සාමාජික, සංස්කෘතික අංග නිසා ඒ විදියේ දුර්වලතාවන් ඇති වුනත් - අර සහතික ක්‍රම - අපි කල්පනා කරන්න ඕන, බුද්ධ කාලය දිහා බලලා බුදු පියාණන් වහන්සේගේ කාලයේ අන්න අර විදියටයි පැවිද්ද ලබාගත්තේ. ඇතුළතින් ඇතිවුනු යම්කිසි ගැඹුරු හැඟීමක් නිසා ඒ තැනැත්තා පැවිද්දට සුදුසු වෙනවා. එතෙන්දී කුල භේදය හරස් වෙන්නේ නැහැ. වයස හරස් වෙන්නෙත් නැහැ. සාමාන්‍ය සමාජ නීතිය වශයෙන් තිබෙන අර අඹුදරුවන්ට නොසළකා හැරීම ආදී දේවල් පිළිබඳවත් බුදු පියාණන් වහන්සේගේ ප්‍රතිපත්තිය විශේෂයි. ඇත්තවශයෙන්ම කියනවා නම් බුදු පියාණන් වහන්සේමයි ඒ රාහුල කුමාරයා අරගෙන ගිහිල්ලා පැවිදි කළේ. නන්ද කුමාරයා අරං ගිහිල්ලා පැවිදි කළේ. ඕවාට චෝදනා කරන්න පුළුවන් සමාජය, ලෝකය ගැන අර විදියේ ආර්ථික දෘෂ්ටි කෝණයෙන් බලනවා නම්. අර කියාපු සමාජ ප්‍රගතිය හැටියට මාරයාගේ පැත්ත අරගෙන සමාජයේ දියුණුව ගැන පවසනවා නම් අන්න බුදු රජාණන් වහන්සේත් ලොකු වැරැද්දක් කළේ. ඊළඟට රජ වෙන්න හිටපු නන්ද කුමාරයා අරගෙන ගියා. රාහුල

කුමාරයා අරගෙන ගියා. කොයිතරම් වැරදි වැඩක්ද? නමුත් ඒක අර බමුණු ධර්මය - බමුණාගේ ආශ්‍රම ධර්ම - අනුව කල්පනා කළොත් තමයි එහෙම වෙන්නේ. බුදු පියාණන් වහන්සේට පෙනුනේ මේ අති දුර්ලභ බුද්ධෝත්පාද කාලයක පමණයි කෙනෙකුට මේ සංසාරයෙන් මිදෙන්න අවස්ථාව තියෙන්නේ. එතකොට ඒ අවස්ථාව අහිමි වෙනවා නම් කෙනෙකුට අර කියාපු අර සමාජ ධර්ම උඩ, ඒක ලොකු වැරැද්දක්. අන්න ඒ නිසයි බුදු පියාණන් වහන්සේ කුල භේදය වත් නොතකා හැරලා අර කියාපු කාරණය අනුව නෙක්ඛම්ම සංකල්පය යම් ආකාරයකින් වැඩුනා නම්, ඒ නැනැත්තා නිර්වාණගාමී ප්‍රතිපදාවේ ගමන් කරන්න සූදානම් නම්, පැවිදි වීමට අවස්ථාව දුන්නෙ මේ ශාසනයේ. ඒ තුළින්, ඒ ගුණ ධර්ම තුළින්, අපට කොතෙකුත් අසන්න ලැබෙනවා, අපට හිතාගන්නවත් බැරි තරම් නිහීන කුල වල එහෙම නැත්නම් දුගී කුල වල තව නොයෙකුත් ඒ විදියේ තත්ත්ව වල අය - දාමරිකයින්, නොයෙකුත් වැරදි කරපු අය - ඒ අය පවා මහා කාරුණික බුදු පියාණන් වහන්සේ අර නියම ආකාරයෙන් නෙක්ඛම්ම අදහස මතු වුනාට පස්සේ පැවිද්දට ළං කරගෙන දෙවි මිනිසුන්ගෙන් වැඳුම් පිදුම් ගන්න මහ රහතන් වහන්සේ කෙනෙක් පවා ඒ තුළින් මතු කරලා දුන්නා. එතකොට ඔන්න ඕකයි නෙක්ඛම්ම සංකල්පය කියලා කියන්නේ.

මේ නෙක්ඛම්ම සංකල්පය ඈත තියෙන දෙයක් නොවෙයි. අර කියාපු විදියට උපෝසථ අට්ඨංග සීලය තුළත්, දස සීලය තුළත් තියෙන්නේ මේ නෙක්ඛම්මට සූදානම් වීමක්. ඒක මේරා යාමෙන් තමයි යම්කිසි අවස්ථාවක අර බෝසතාණන් වහන්සේ කළා වගේ තමන්ගේ ඥාතීන්ගෙන් සමු අරගෙන ධන සම්භාර, නිලතල අතහැරලා දාලා අර කියාපු පැවිදි ජීවිතට නැඹුරු වෙලා තමන්ගේ ජීවිතයේ අවසාන කාලයේ හෝ යම්කිසි සැනසීමක් - අර බුදු පියාණන් වහන්සේ දක්වූවා වූ නියම ධර්මය සැනසීමක්, විමුක්තියක් - ලබාගන්නට පුළුවන් වෙන්නේ. ඒක තමයි බුදු පියාණන් වහන්සේ ගිහි ජීවිතය පිළිබඳවත් තමන් වහන්සේගේ පැවිදි වීම පිළිබඳවත් ප්‍රකාශ කරන්නේ.

සම්බාධොයං ඝරාවාසො - රජස්සායතනං ඉති
අබ්භොකාසොව පබ්බජ්ජා - ඉති දිස්වාන පබ්බජි

මේ ගිහි ජීවිතය මේක බොහොම කරදරකාරී තැනක්. අන්න අර හිර ගෙදරක් වගේ. බන්ධනාගාරයක් වගේ සම්බාධ තත්ත්වයක්. මේක කියන කොට ගිහි ජීවිතේම ගැලිලා ඉන්න පින්වතුන් සමහර විට මේකට විරුද්ධ වෙන්න පුළුවන්. නමුත් අර සැනෙන කාලයක් සැපෙයි කියලා හිතාගෙන

මේවායේ යෙදෙන කෙනාට කලක් යනකොට තේරෙනවා මේක මහා කරදරකාරී තැනක්. ගිහි ගෙයක් වගේ එකක්. 'සම්බාධොයං ඝරාවාසො' මහා බාධක සහිත තැනක්, නියම ආධ්‍යාත්මික වගාවට සුදුසු පරිසරයක් නොවේ. ඒ වගේම 'රජස්සායතනං ඉති' කෙලෙස් රජස්, කෙලෙස් දූවිලි, ඇති කරන උපදවන ආයතනයක්, කර්මාන්ත ශාලාවක්, කෙලෙස් උපදවන කර්මාන්ත ශාලාවක් වගෙයි. ඉතිං ඒක නිසා 'අබ්භොකාසොව පබ්බජ්ජා' ඒකට සංසංදනය කරලා බලන කොට පැවිද්ද කියන එක අභ්‍යවකාශයක් - විවෘත ස්ථානයක් - වගෙයි. විවේක එළිමහන් තැනක් වගෙයි.

ඉතිං අන්න ඒ විදියට අපි කල්පනා කරන්න ඕන. ගිහි පින්වතාට ඒ තත්ත්වය වැටහුනොත් ඇත්ත වශයෙන් බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළා වගේ පැවිද්ද අභ්‍යවකාශ තත්ත්වයේ නැත්නම් ඒ තැනැත්තාට කරකියාගන්න දෙයක් නැහැ. ගිහි ජීවිතයේ අර තරම් දුක් කරදර දකලා, මේක හිර ගෙදරක් කියලා දකලා, මේකෙන් නිදහස් වෙන්න ඕන කියලා පැවිදි වෙනවා. නමුත් පැවිද්දට ගිහිල්ලා බලන කොට පැවිද්දේ තියෙන තත්ත්වය අභ්‍යවකාශය නොවේ නම්, එළිමහන නොවේ නම්, ඒක අරිටත් වැඩිය මහා කරදර සංකීර්ණතා මහා බන්ධන සහිත, තණ්හාවට, ගිජු කමට බැඳුන තැනක් නම්, ඒ තැනැත්තාට කරකියාගන්න දෙයක් නැහැ. එතනම තමයි බුද්ධ ශාසනයේ අවසානය. අන්න ඒක නිසා, අපි නුවණින් කල්පනා කරන්න ඕන. අපි මේව ගැන දැනුවත් වෙන්න ඕන. මෙන්න මේ බුදු පියාණන් වහන්සේ මතු කරලා දීලා තියෙන මේ නෙක්ඛම්ම සංකල්පය - අපි මේක ආරක්ෂා කරගන්න ඕන. ආරක්ෂා කරගන්නේ අපේ හද පත්ලේ මේක වගා කර ගැනීමෙන් ක්‍රමානුකූලව. ඒ වගේම මේවායේ වටිනාකම ගිලිහී යන්ට නොදී, අවතක්සේරුවට භාජනය වෙන්න නොදී, තමතමන්ගේ සිතුම් පැතුම්, ප්‍රාර්ථනා, ක්‍රියා පටිපාටි ක්‍රියාදාමයන් සකස් කරගන්ට ඕන. ඉතිං ශාසනික වටිනාකම් මතුකර දීමයි අපේ යුතුකම වී තිබෙන්නේ. නොයෙකුත් විදියේ විපර්යාස සිදුවෙනවා - සමාජ විපර්යාස. අපි අර කිව්වා වගේ, යම්කිසි අවස්ථාවක පැවිද්දට භාවිතා කෙරෙන ඒ වාක්‍ය පවා වෙනස් වුනොත් අපට මේ විදියේ දෙයක් අලුතුවෙන් කියන්න අවශ්‍යතාවක් නැහැ. අපට මෙතෙක් ඒක වෙනස් කළ බවක් අහන්න ලැබිලා නැහැ. ඒක නිසයි අපි මේ මතක් කරලා දෙන්නේ, පැවිද්ද කියන එක අන්න අර විදියේ ගැඹුරු නෙක්ඛම්ම අදහසකින් කළ යුතු දෙයක් කියලා.

ඒ නිසා අපි ඒක ගැන කල්පනාකාරී වෙන්න ඕන. ඒකට උපකාර වන ආහාර කොටසකුත් තියෙනවා. දැන් ගිහි ජීවිතය පෝෂණය කරන ආහාර නම් අනන්ත අප්‍රමාණව ඔය බටහිරින් එහෙම සම්පාදනය කරල

තියෙනව විද්‍යාත්මක නවීන ක්‍රම වලින්. මේ පින්වතුන් දන්නවා විසිත්ත කාමර වල තියෙන දේවල්. මුළු දවසම තමතමන්ගේ මේ කුඩා දරුවන්, නොදන්නා දරුවන් දරු සප්පයින්, ඇදිලා යන දේවල්. ඒවා මොනවාද කියලා දන්නවා. එතකොට ඒ ආහාර අන්න අර කියාපු මාරයාගේ මාර පාක්ෂික ධර්ම. ඊළඟට බුදු පියාණන් වහන්සෙ දක්වනවා තවත් ආහාර කොටසක්. ඒක අර නෙක්ඛම්ම සංකප්ප ආදී උසස් සිතුම් පැතුම් වලට ඕන කරන ආහාර. ඒ ආහාර හොයාගෙන තමයි මේ බෞද්ධ පින්වතුන් පසළොස්වක වගේ පොහොය දවස් වල අටසිල් සමාදන් වන්නේ. උපෝසථ සීලය රකින්නේ. භාවනා මධ්‍යස්ථාන කරා යන්නේ. ඒ අර ආධ්‍යාත්මික ගුණ වගාව. අපි කල්පනා කරනවා හැම කෙනා තුළම තියෙනවා කියලා අස්සාද - ආදීනව - නිස්සරණ කියන ඒ සංසාරේ දියුණු කරගෙන ආපු, එහෙම නැත්නම් සංසාරේ විඳපු යම් අත්දැකීම් රාශියක්. ආස්වාද පක්ෂයක් තියෙනවා. ඊළඟට නොයෙකුත් ඒ ආස්වාද සොයන්න ගිහිල්ලා දුකට පත්වෙලා කරකියාගන්න දෙයක් නැතුව "අනේ මේ මොන දුකක් ද කවද හරි මේ දුකෙන් නිදහස් වෙන්න ඇත්නම්" කියන ඒ නිස්සරණ අදහස. ඒවා යම් යම් අවස්ථාවල සංසාරයේ ජීවිතවල මතු කරගෙන ඇති. නමුත් අපට ඕන කරන්නේ, බුදු පියාණන් වහන්සේ දක්වන්නේ අන්න අර නිස්සරණය. ආදීනව පක්ෂයත් ඒ තුළින් නිස්සරණයත් මතුකර ගන්න හැටියටයි බුදු පියාණන් වහන්සේ අපට මතක් කරලා දෙන්නේ. ඒකමයි බුදු පියාණන් වහන්සේ හැම අවස්ථාවකම, මේ මහා සැප සම්පත් - මනුෂ්‍යයින් ආර්ථික වශයෙන් ලබන සැප සම්පත් පමණක් නොවේ, අපි එදිනෙදා ජීවිතයේ දී හිතන පතන චක්‍රවර්ති රාජ්‍ය ගැන පවා, චක්‍රවර්ති රජවරු ගැන පවා විස්තර බුදු පියාණන් වහන්සේ සූත්‍ර දේශනා වල දක්වන්නේ අනුහාරදාහෙ මේ මේ තරම් සැප සම්පත් වින්දා. නමුත් අවසාන කරන්නේ "මහණෙනි, මේ සියල්ලම අනිත්‍යයි, මේ සියලු සංස්කාර අනිත්‍යයි, ඒ රජුත් ඉවරයි. ඒ තිබුණු සම්පතුත් ඉවරයි. ඒ ඔක්කොම ඉවරයි." අන්න ඒ විදියට දක්වනවා. ඊළඟට දෙවියන්, බ්‍රහ්මයින් පිළිබඳවත් බුදු පියාණන් වහන්සේ දක්වන්නේ අනිත්‍ය ස්වභාවයයි.

එතකොට බුද්ධ වචනය ගැන අපි ඒ විදියට කල්පනා කරලා බලනවා නම් අපේ මේ ශාසනික වටිනාකම් අනුව උපරිම තත්ත්වය හැටියට අපිට හිතන්න තියෙන්නේ අන්න අර "සබ්බ දුක්ඛ නිස්සරණ" කියන නිර්වාණ පරමාර්ථයයි. මේක ඈත අනාගතයකට, අතීත බුද්ධෝත්පාද කාලයට, දැම්මටත් නොවේ. මේ බුද්ධෝත්පාද කාලයේ පවා මේක අවතක්සේරුවට ලක්කරන්නේ නැතුව තමතමන්ගේ චිත්ත සන්තානයේ ඒකට අදාළ ගුණ ධර්ම දියුණු කරගන්නවා නම්, සත්තිස් බෝධි පාක්ෂික ධර්ම - සතර

සතිපට්ඨාන ආදී වශයෙන් දක්වන ඒ ගුණ ධර්ම - දියුණු කරගන්නවා නම්, මේ ජීවිතයේදීම අවම වශයෙන් අපට පුළුවන් අපාය භයෙන් නිදහස් වෙන්න සෝවාන් තත්ත්වය ලබාගෙන. අතීතයේ බුද්ධ කාලයේත්, ආනන්ද හාමුදුරුවෝ අසනවා සෝවාන් වූ අය පිළිබඳව. සමහර ගම් වල සෝවාන් වුනු අය සිය ගණන් බව බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ගිහියන් අතර. ඒ වගේ ඒ ගිහි පින්වතුන් අතර අනෙක් ඉහළ මාර්ග ඵල අනාගාමී තත්ත්ව පවා ලබාගත්තු ශ්‍රේෂ්ඨ ධර්ම ඥානයක් ඇති චිත්ත ගෘහපති හත්ථක ආලවක ආදීන් ගැන ධර්ම කථා වල සඳහන් වෙනවා. ඒ නිසා ගිහි පින්වතුන් කිසිසේත් හිත දුර්වල කරගන්න නරකයි. කොයියම් විදියෙ බාධක තිබුණත් - අර කියාපු විදියට ගිහි ගෙදරවල් වල බාධා අනික් තැන්වලත් බාධා - නමුත් ඒවා මැඩ ගෙන යන්න තරම් අපේ නෙක්ඛම්ම ශක්තිය දැඩි නම්, අපේ මිනෑකම, ඡන්දය දැඩිනම්, අපට පුළුවන් මේ අවස්ථාවේ පවා, මේ ශාසන පහන තිවෙන්න ආසන්න අවස්ථාවේ පවා, යමක් කරගන්න.

මේ ටික මතක් කරදීම අපි හිතනවා කාලෝචිතය කියලා. සමහර විට මේක යල් පැනපු දේශනයක් වන්වත් ඉඩ තියෙනවා. කෙසේ හෝ වේවා මේ කාරණා වලට මේ පින්වතුන් හිත යොදවලා තමතමන්ගේ ඒ දියුණු කරගෙන ආපු සිල් ගැනීම් ආදියේ ගැඹුරු පරමාර්ථය ඒ තුළින් මතුකරගන්න ඕන. සීල සමාදානය කියන එකත් මෙතන මේ සුදු වස්ත්‍ර ඇඳපු මේතරම් පිරිසක් මෙතන සිල් ගන්නා කියලා කියන ඒ විදියේ සංකල්පයක් ඇති කිරීමටවත් නොවෙයි. මේකෙ පරමාර්ථය තමතමන්ටමයි. තමන්ගේ අර කියාපු දළඹු තත්ත්වයේ ඉඳලා සමනළ තත්ත්වය දක්වා යන ගමනෙ එක අවස්ථාවක් කියලා හිතාගත්තත් වරදක් නැහැ. ඒ විදියේ තමන්ගේ සිතට අල්ලන යම්කිසි සංකල්පයක් ඉදිරියේ තියාගෙන ගිහි කරදර බාධක මධ්‍යයේ නමුත් ඒක කරගෙන යනකොට තමන්ගේ චිත්ත සන්තානයේ නෙක්ඛම්ම සංකල්ප මෝරා යාමෙන් යටත් පිරිසෙයින් වයෝවෘද්ධ අවස්ථාවේදී හෝ අඹුදරුවන්ගෙන් සමුඅරගෙන පැවිදි වෙන්න පුළුවන්. එහෙම බැරිවුනොත් මරණ අවස්ථාවේදී අනික් අය වැළපෙන අතරෙ තමන්ගේ හිත සන්සුන් කරගෙන තමන් පැවිදි වෙන්න හිටපු පැවිදි රූපය සිහියට නඟාගෙන ලොකු සැනසීමකින් කාලක්‍රියා කරන්න පුළුවන්. අන්න ඒ තරම් වටිනා දෙයක්.

එතකොට මේ පින්වතුන් කල්පනා කරන්ට ඕන මේ ශාසනික වටිනාකම් රැක ගැනීමයි අපි බුද්ධ ශාසනය රැක ගැනීමයි කියන්නේ. මේවා බාහිරව රකින දේවල් නොවේ. අපේ චිත්ත සන්තානයේ මේවා පිළිබඳව තිබෙන, සාරධර්ම පිළිබඳව තිබෙන, අගය කිරීම් හා සම්බන්ධ සිතුම් පැතුම්

හරිගස්සගන්න ඕන. එතකොට මේ කථාන්තරයෙනුත් මේ ගාථාවෙනුත් ගත යුතු සාරය අරගෙන මේ පින්වතුන් තමතමන් අද දින උපෝසථ සීලයක් සමාදන් වීමෙන් මේ ආජීව අට්ඨමක සීලය සමාදන් වීමෙන් කරන්නේ කය වචනය සංවර කර ගැනීමයි. ඊළඟට ඒක උපකාර කරගෙන බණ භාවනා කරලා සිත සමාධිමත් කරගෙන, අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් බුදු පියාණන් වහන්සේ දක්වා වදාළ මේ ලෝකයේ යථා තත්ත්වය හරියාකාර යම් අවස්ථාවක අවබෝධ කරගත්තා නම් ඒ තැනැත්තාට පුළුවන් සෝවාන් ආදී මාර්ග ඵල ලබන්න. ඒ ශක්තියත් ධර්ම ශ්‍රවණයේ ආනිසංසයත් උපකාර කරගෙන මේ පින්වතුන් මේ අවස්ථාවේ දියුණු කරගත් සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා කියන ඒ ශක්තීන්ගේ අවසාන ප්‍රතිඵලය වශයෙන් සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් කියන ඒ මාර්ගඵල අවබෝධයෙන් මේ අතිභයානක සංසාර දුක්ඛයෙන් මිදිලා උතුම් අමාමහ නිවන් සාක්ෂාත් කර ගැනීමට ධර්ම ශ්‍රවණ ආනිසංස හේතු වාසනා වේවා! ඒ වගේම තම තමන් නමින් නෑසී මිය පරලොව ගියාවූ ඥාතීන් ඇතුළු අවීචියේ සිට අකනිට්ඨාව දක්වා වූ සියළු සත්ත්වයිනුත් ඒ ශාසනාරක්ෂක දිව්‍ය බ්‍රහ්ම මණ්ඩලයේ හැම කෙනෙක්මත් මේ ධර්ම ශ්‍රවණමය ධර්ම දේශනාමය කුසලය අනුමෝදන් වෙත්වා! අනුමෝදන් වී තම තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහා නිවනින් සැනසෙත්වා කියන ප්‍රාර්ථනය ඇතිව මෙන්න මේ ගාථා කියල පින් පමුණුවන්න.

'එතතාවතා ච අම්හෙහි .........'